11.07.2016

REFERENCE ONLY

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

**ඉතිහාසය** **9 ශ්‍රේණිය**

විභාග අංකය :........................................ කාලය පැය 02 යි

## I කොටස

* I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. අප රට වැඩි කාලයක් පාලනය කළ බටහිර ජාතිය වනුයේ,
(1) පෘතුගීසින් ය (2) ඉංග්‍රීසින් ය (3) ලන්දේසින් ය (4) ප්‍රංශ ජාතිකයින් ය

02. ලංකාවට පැමිණි බටහිර ජාතීන් පැමිණි අනුපිළිවෙළ නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද?
(1) පෘතුගීසි, ඉංග්‍රීසි, ලන්දේසි. (2) ලන්දේසි, පෘතුගීසි, ප්‍රංශ.
(3) ඉංග්‍රීසි, පෘතුගීසි, ලන්දේසි. (4) පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි.

03. "අ" වලින් දක්වෙන ඉංග්‍රීසි ආණ්ඩුකාරවරුන්ට "ආ" වලින් දක්වෙන සිද්ධි සම්බන්ධ කළ විට පිළිතුර වනුයේ,

| "අ" | "ආ" |
|---|---|
| (I) ස්ටුවර්ඩ් මැකෙන්සි | A - රාජකාරි ක්‍රමය අවලංගු කිරීම |
| (II) තෝමස් මේට්ලන්ඩ් | B - මුදුබිම් පනත පැනවීම |
| (III) ෆෙඩ්‍රික් නෝර්ත් | C - රාජකාරි ක්‍රමය යළි පිහිටුවීම |

(1) BAC ය (2) BCA ය (3) CAB ය (4) ACB ය

04. පළමු නිදහස් අරගලය ආරම්භ වූයේ,
(1) කුරුණෑගල ප්‍රදේශයෙනි. (2) මාතලේ ප්‍රදේශයෙනි.
(3) වෙල්ලස්ස ප්‍රදේශයෙනි. (4) දඹුල්ල ප්‍රදේශයෙනි.

★ අංක 05 සිට 08 දක්වා ප්‍රශ්නවලට පහත ප්‍රකාශ අදාළ කරගෙන පිළිතුරු සපයන්න.

A - රත්වත්තේ අධිකාරම්, දුල්ලෑව අධිකාරම්
B - පුරන්අප්පු, ගොංගාලේගොඩ බණ්ඩා
C - වීර කැප්පෙටිපොළ, මඩුගල්ලේ දිසාව
D - දොරේසාමි, කණ්නසාමි
E - ඇහැලේපොල, පිළිමතලාවේ

05. 1848 දෙවන නිදහස් අරගලයට සම්බන්ධ නායකයන් දෙදෙනෙක් දක්වා ඇත්තේ,
(1) B වලිනි. (2) E වලිනි. (3) A වලිනි. (4) C වලිනි.

06. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුට විරුද්ධව කටයුතු කළ දෙදෙනෙකු දක්වෙන්නේ,
(1) A වලිනි. (2) D වලිනි. (3) E වලිනි. (4) C වලිනි.

07. 1818 නිදහස් අරගලයේ දී ජීවිත පරිත්‍යාග කළ විරුවන් දෙදෙනෙක් දක්වා ඇත්තේ,
(1) B වලිනි. (2) C වලිනි. (3) D වලිනි. (4) E වලිනි.

08. 1815 උඩරට ගිවිසුමට අත්සන් කළ නිලධාරීන් දෙදෙනෙකු අතුළත් පිළිතුර කුමක් ද?
(1) D (2) C (3) B (4) A

09. ලංකාවේ ආදායමට වඩා වියදම ඉහළ යාම නිසා ඒ පිළිබඳ සොයා බැලීම සඳහා පත් කළේ,
(1) මියුරන් කොමිසම ය. (2) කෝල්බෲක් කොමිසම ය.
(3) ඩොනමෝර් කොමිසම ය. (4) සෝල්බරි කොමිසම ය.

10. මෙරට ඉංග්‍රීසි බෞද්ධ පාසල් පිහිටුවීමට පුරෝගාමී වූයේ,
(1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය (2) C. W. W. කන්නන්ගර මහතා ය.
(3) D. S. සේනානායක මහතා ය. (4) S. මහින්ද හිමි ය.

11. A - ලංකාව පළාත් 5 කට බෙදීම.
B - ව්‍යවස්ථාදායක විධායක සභා පිහිටුවීම.
C - සර්වජන ඡන්ද බලය ලබාදීම.
ඉහත ප්‍රකාශ අතරින් කොල්බෲක් ප්‍රතිසංස්කරණවලට අදාළ ලක්ෂණ අතුළත් පිළිතුර වන්නේ,
(1) A හා C පමණි. (2) B හා C පමණි.
(3) A හා B පමණි. (4) A, B, C ලක්ෂණ 3 ම ය.

12. කෲව් මැකලම් ආණ්ඩු ක්‍රමයේ ව්‍යවස්ථාදායක සභාවේ සභික සංඛ්‍යාව වූයේ,
(1) 15කි. (2) 61කි. (3) 37කි. (4) 21කි.

13. යාපනයේ අධ්‍යාපන කටයුතු මෙහෙය වූ මිෂනාරි ආයතනය වනුයේ,
(1) වෙස්ලියන් සංගමය ය. (2) බැප්ටිස්ට් සංගමය ය.
(3) චර්ච් මිෂනාරි සමාගම ය. (4) ඇමරිකානු මිෂනාරි සමාගම ය.

14. "අ" කොටසේ දක්වා ඇති නායකයින් "ආ" කොටසේ ඔවුන් ආරම්භ කළ ආයතන සමග ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| "අ" | "ආ" |
|---|---|
| (I) රත්මලානේ ධම්මාලෝක හිමි | A - විද්‍යාලංකාර පිරිවෙන |
| (II) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි | B - මහාබෝධි සංගමය |
| (III) අනගාරික ධර්මපාලතුමා | C - විද්‍යෝදය පිරිවෙන |

(1) CAB (2) ACB (3) BAC (4) CAB

15. මරදානේ සහිරා විද්‍යාලයේ විදුහල්පතිධුරය දරමින් එය දියුණු කිරීමට කටයුතු කළේ,
(1) ටී. බී. ජයා මහතා ය. (2) පොන්නම්බලම් රාමනාදන් මහතා ය.
(3) සිද්දි ලෙබ්බේතුමා ය. (4) අරුණාචලම් මහතා ය.

16. යාපනයේ වණ්ණාර්පණ්ණෙයි ඉංග්‍රීසි පාසල ආරම්භ කළේ,
(1) පොන්නම්බලම් රාමනාදන් මහතා ය. (2) අරුණාචලම් මහතා ය.
(3) ආරුමුගනාවලර්තුමා ය. (4) මුතුකුමාරස්වාමි මහතා ය.

17. "මාගේ බලාපොරොත්තුව මව්බිමට සේවය කිරීමයි. ප්‍රශංසා සහ ත්‍යාග සෙවීම නොවේ." මෙසේ ප්‍රකාශ කළේ,
(1) ඒ. ඩබ්. පෙරේරා මහතා ය. (2) ටී. බී. ජයා මහතා ය.
(3) ඩී.බී. ජයතිලක මහතා ය. (4) ඒ. ඊ. ගුණසිංහ මහතා ය.

REFERENCE ONLY

18. ඩොනමෝර් රාජ්‍යමන්ත්‍රණ සභාවේ කෘෂිකර්ම හා ඉඩම් කාරක සභාවේ සභාපති ධුරයට පත්වූයේ,
(1) සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ය. (2) ඩී. බී. ජයතිලක මහතා ය.
(3) ටී. බී. පානබොක්කේ මහතා ය. (4) ඩී. එස්. සේනානායක මහතා ය.

19. සෝල්බරි ආණ්ඩු ක්‍රමයට අදාළ යෝජනාවක් වනුයේ,
(1) සර්වජන ඡන්ද බලය ලබාදීම ය. (2) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම ය.
(3) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය පිහිටුවීම ය. (4) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම ය.

20. ප්‍රථම සිංහල අග්‍රාණ්ඩුකාරවරයා වනුයේ,
(1) ඔලිවර් ගුණතිලක මහතා ය. (2) විලියම් ගොපල්ලව මහතා ය.
(3) ඩී. බී. ජයතිලක මහතා ය. (4) ඊ. ඩබ්. පෙරේරා මහතා ය.

## II කොටස

* පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 04 කටත් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

01. දෙවන වාරයට නියමිත ඇගයීම් ක්‍රියාවලියේ දී ඔබේ ඉතිහාස ගුරුතුමා හෝ ගුරුතුමිය විසින් කරන ලද ක්‍රියාකාරකම ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.
1) ඔබට / ඔබ කණ්ඩායමට ලැබුණු විෂය මාතෘකාව කුමක් ද ? (ල. 2)
2) ඔබට / ඔබ කණ්ඩායමට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ල. 2)
3) ක්‍රියාකාරකම සඳහා තොරතුරු ලබාගත් මූලාශ්‍ර තුනක් ලියන්න. (ල. 3)
4) මෙම ඇගයීම සිදු කිරීමේදී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් සඳහන් කරන්න. (ල. 2)
5) මෙම ක්‍රියාකාරකමේදී ඔබ ඉටුකළ කාර්යය පිළිබඳ වාක්‍ය තුනක් ලියා දක්වන්න. (ල. 3)
6) මෙම ඇගයීම් ක්‍රියාවලිය තුළින් ඔබ ලබාගත් ප්‍රයෝජන හතරක් ලියන්න. (ල. 4)

02. 1) බ්‍රිතාන්‍යයන් අප රට අල්ලා ගැනීමට පෙර උඩරට රජුන් හමු වූ ඉංග්‍රීසි දූතයන් දෙදෙනෙකු ලියන්න. (ල. 2)
2) ඉංග්‍රීසින් ලංකාව අල්ලා ගැනීමට බලපෑ හේතු හතරක් ලියා දක්වන්න. (ල. 4)
3) ඉංග්‍රීසින්ට උඩරට රාජ්‍ය අල්ලා ගැනීමට අවශ්‍ය වූයේ ඇයිදැයි කරුණු 02 ක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

03. 1) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා දළදා මැදුරේ හා නගරයේ අලංකාරය උදෙසා කළ නිර්මාණ දෙකක් ලියන්න. (ල. 2)
2) උඩරට ගිවිසුම සම්බන්ධ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - ගිවිසුම අත්සන් කළ ස්ථානය.
B - ගිවිසුමට ඉංග්‍රීසි පාර්ශවයෙන් අත්සන් කළ තැනැත්තා.
C - ගිවිසුමට විරෝධය පා ඉංග්‍රීසි කොඩිය බිම දමා විරෝධය පෑ භික්ෂූන් වහන්සේ.
D - ගිවිසුමෙන් පසු උඩරට සඳහා පත් කළ නිත්‍ය නියෝජිතයා (රෙසිඩන්ට්). (ල. 4)
3) 1818 පළමු නිදහස් අරගලයට බලපෑ හේතු 02 ක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 5)

04. 1) A - බ්‍රිතාන්‍යයන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ අල්ලාගන්නා විට උඩරට පාලනය කළ රජු ද
B - බ්‍රිතාන්‍යයන් 1815 උඩරට අල්ලා ගන්නා විට එහි සිටි රජු ද නම් කරන්න. (ල. 2)

2) 1818 හා 1848 නිදහස් අරගල ක්‍රියාත්මක වන කාලයේ ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු දෙදෙනාගේ නම් ලියා දක්වන්න. (ල. 4)

3) 1848 නිදහස් අරගලයේ ප්‍රතිඵල 02ක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 5)

05. 1) කෝල්බෲක් කොමිසම ලංකාවට පැමිණීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල. 2)

2) 1833, 1910, 1920, 1924 ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අනුපිළිවෙළින් ලියන්න. (ල. 4)

3) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ලාංකිකයන්ට වැඩි බලතල ලබාදුනි. එවැනි බලතල 02ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

06. 1) බ්‍රිතාන්‍ය මිෂනාරි සමාගම් ආගම ප්‍රචාරය සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.(ල. 2)

2) බෞද්ධාගමික පුනර්ජීවනය උදෙසා විවාද පැවැත් වූ ස්ථාන හතරක් ලියන්න. (ල. 4)

3) අනගාරික ධර්මපාලතුමා පිළිබඳ වාක්‍ය පහක් ලියා දක්වන්න. (ල. 5)

07. 1) A - 1922 ආරම්භ වූ කම්කරු පක්ෂයේ නායකයාත්
B - 1935 ආරම්භ වූ ලංකා සම සමාජ පක්ෂයේ නායකයාත් A, B අනුපිළිවෙළින් නම් කරන්න. (ල. 2)

2) A - නිදහස් අධ්‍යාපනයේ පියා
B - හින්දු පුනර්ජීවනයේ පියා.
C - ඉස්ලාම් ආගමික පුනර්ජීවනයේ නායකයා
D - බෞද්ධ පුනරුදයට නායකත්වය දුන් ඇමරිකානු ජාතික නායකයා
ඉහත කරුණු හා සම්බන්ධ පුද්ගලයන් A, B, C, D අනුපිළිවෙළින් ලියන්න. (ල. 4)

3) ඉහත ඔබ දක්වූ එක් නායකයෙකුගෙන් සිදු වූ සේවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)